**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බැලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය වාරික ආපසු ගෙවීම් රු.464,754 ක් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි වියදමක් ලෙස ගිණුම් ගත කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) බැංකු ගිණුම් අංක 2247306 දරණ පරිසර ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට රු.720,224 ක මුදල් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.722,624ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.2,400 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද රු.96,800 ක අදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි පුනරාවර්තන අදායම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ඇගයීම් කම්ටු දීමනා හා බලපත්‍ර කම්ටු දීමනා රු.12,400 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) තොග ලේඛනය හා පාරිභෝජන ද්‍රව්‍ය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ තොග ශේෂය වූ රු.2,017,202 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.1,765,322 ක් ලෙස ගෙන තිබීමෙන් අවසාන තොගය රු.251,880 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වටිනාකම රු.14,200 ක් වූ " ජී.අයි.පොටකපන යන්ත්‍රය" මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් වල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවන ලද වැටුප් වලට අදාලව ලැබිය යුතු අදායම් අධාර රු.1,747,685 ක් පොදු ලෙජරයේ වැටුප් ගිණුම් වලට නිවැරදිව ගැලපුම් කර ඇති නමුත් මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අදායම් ණය ගැතියෝ යටතේ හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.3,542,029 ක වටිනාකමකින් යුතුව ඉදිකරන ලද ගොඩනැගිලි, මිලදී ගන්නා ලද ලී බඩු සවිකිරීම සහ පුසතකාල පොත්,රු.1,933,343 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් ජංගම නොවන වත්කම් රු.1,608,686 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සභාව මඟින් පවත්වාගෙන යනු ලබන ''නැණසල'' මධ්‍යස්ථානයට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් පරිත්‍යාග කරන ලද රු 400,904 ක් වටිනා පරිගණක උපාංග ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ '' දියපහස ''ගිමන් හල බදු දීමට අදාලව හිඟ බදු,දඩ මුදල් හා හිඟ ජල ගාස්තු වශයෙන් ලැබිය යුතු රු.51,660 ක් මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ලැබිය යුතු ගිණුම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් රු.1,717,960 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඕ) පුස්තකාල පොත් ගිණුමේ රු.2,247,628 ක් වූ ශේෂය මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රු.1,536,439 ක් ලෙස දක්වා තිබීමෙන් පුස්තකාල පොත් වටිනාකම රු.711,189 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ක) ලෙජරයෙහි වෙනත් අදායම් සහ අදායම් අධාර ගිණුම් වල එකතුව වූ රු.17,393,795 ක් මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු.17,841,457 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අදායම රු.447,662 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ග) ලෙජරයෙහි වෙනත් අදායම් හා බලපත්‍ර ගාස්තු ගිණුම් වල එකතුව වූ රු.788,749 ක් මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු.683,299 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අදායම රු.105,450 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ගලා යාමක් ලෙස හෙළිදරව් කළ යුතු වර්ෂය තුළ දේශීය ණය සංවර්ධන අරමුදලේ පොලී ආපසු ගෙවීම් රු.164,743 ක් මුල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ම) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාලපරිච්ඡේදය අවසානයේ රු. 1,275,801 ක් වූ මුදල් හා මුදල් සමාන දෑ,රු.1,278,201 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු. 2,400 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2. **නොසැසඳුන ගිණුම් ශේෂ**

-----------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පොදු තැන්පතු ලේඛණයෙහි කේවල ශේෂ වල එකතුව වූ රු2,940,376 ක්,පාලන ගිණුමේ විවිධ තැන්පතු යටතේ රු.2,675,809 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් පාලන ගිණුම හා කේවල ශේෂ ලේඛනය අතර රු.264,567 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අත්තිකාරම් ලේඛණයේ එකතුව වූ රු.7,447,173ක්, අත්තිකාරම් පාලන ගිණුමේ රු.5,493,505 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් පාලන ගිණුම හා අත්තිකාරම් ලේඛනය අතර රු.1,953,668ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සේවක ඇප ලේඛනයේ ඇපතැන්පත් රු.242,698 ක්, සේවක ඇප තැන්පත් පාලන ගිණුමේ රු.245,059 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් පාලන ගිණුම හා ඇප ලේඛනය අතර රු.2,361 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) අංක 0002247304 දරණ ජංගම ගිණුමට අදාලව 2015 වර්ෂයේ අප්‍රේල්, ජූනි, ජූලි, අගෝස්තු මාස වලට අදාලව පිළියෙල කරන ලද බැංකු සැසඳුම් වාර්තා අනුව මුදල් පොතේ ශේෂ සහ ප්‍රධාන මුදල් පොතේ ශේෂ සමඟ සැසඳීමේ දී රු.95,609 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී පළාත් සභා ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වෙත ලබාදුන් රු.1,560,000 ක් වූ යතුරුපැදි ණය මුදලින් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් 07දෙනෙකු ගෙන් අයවිය යුතු රු.44,216ක ණය ශේෂයක් විගණිත දිනය වූ 2016 මාර්තු 31 දින දක්වාම අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ගමින් ගමට දොරින් දොරට වැඩසටහන යටතේ 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් 12 ක් සඳහා රු.4,200,813 ක් සභා අරමුදලින් ගෙවා තිබූ නමුත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අදාල මුදල 2016 මාර්තු 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.91,029,726ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5. **නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

---

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ).ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) 571 රෙගුලාසිය | 2015 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රු.2,675,809 කට අදාලව තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (අ) සබරගමුව පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහය | |
| (i) 261.2.7 රීතිය | 2002 වර්ෂයේ සිට නිකුත් කරන ලද එකතුව රු.7,447,173 ක අතුරු අග්‍රිම විගණිත දිනය වූ 2016 මාර්තු 30 දක්වා පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>-------------------------------- | |
| (i) | 214 රීතිය | 2015 දෙසැම්බර් 31 දිනට රු.2,017,202 වටිනා ගබඩා හා ද්‍රව්‍ය සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>-------------------------------- | |
| (i) | 4.2.1 (අ) මාර්ගෝපදේශය | ප්‍රාදේශීය සභාව විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය | සභාව සතුව පවතින රු.659,022 ක් වටිනා පරිගණක හා උපාංග පරිගණක වත්කම් ලේඛණයක ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 9,520,754ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායමරු.9,039,252ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.481,502ක වර්ධනයක් ඇති වී තිබුණි

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු. 7,080,213කින් වැඩි වී මත්, ගමන් වියදම වෙනුවෙන් කළ වියදම ඉකුත් වර්ෂයට වඩා රු. 538,862කින් අඩු වී තිබීමත් ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

------------------------

#### 2.3.1 වරිපනම් බදු

**-------------**

2013 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් ගාස්තු රු.53,568 ක ශේෂයකින් රු.23,393 ක් එනම් සියයට 44 ක් සහ සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වරිපනම් ගාස්තු රු.111,305 කින් රු.14,481 ක් එනම් සියයට 13 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.2 **අක්කර බදු**

------------

2014 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ අක්කර බදු රු.63,232 ක ශේෂයකින් රු.60,782 ක් එනම් සියයට 96 ක් සහ සමාලෝචිත වර්ෂයේ අයවැයගත අක්කර බදු රු.20,000 කින් රු 9,409 ක් එනම් සියයට 46 ක් අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.3 ජල ගාස්තු

-----------

2014 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ ජල ගාස්තු රු.2,641,233 කින් රු.1,341,452 ක් එනම් සියයට 51 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.4 **මුද්දර ගාස්තු**

-------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා ලැබිය යුතු රු8,883,725 ක මුද්දර ගාස්තු විගණිත දිනය වූ 2016 මාර්තු 30 දින දක්වා අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාල ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.5 **උසාවි දඩ මුදල්**

---------------

2013 සැප්තැම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා වූ මාස 28 කට අදාලව එකතුව රු.1,065,617 ක් වූ උසාවි දඩ මුදල් සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් ලබාගැනීමට විගණිත දිනය වූ 2016 මාර්තු 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

3.1 **මානව සම්පත් කළමණාකරණය**

--------------------------------

අනුමත කාර්යමණ්ඩලයේ අදායම් පාලක තනතුරු 02 ක් පුරප්පාඩුව පවතින අතර 2014 වර්ෂයේ සිට එම තනතුරෙහි රාජකාරි ක්ෂේත්‍ර කම්කරුවෙකු විසින් ආවරණය කරනු ලබන බැවින් සමාලෝචිත වර්ෂයේ සභාවේ ඉලක්ක ගත අදායම් අයකර ගැනීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) හල්පේ ගොඩතලාව මාර්ගය පස් දමා තලා වැඩිදියුණු කිරීම වෙනුවෙන් රු:394,934 ක් ගෙවා තිබුණි.මේ සඳහා රු:139,586 ක පස් කියුබික් මීටර් 165 ක් යොදා තිබුනද, මාර්ග තලනයක් අධාරයෙන් පස් තැලීමට කටයුතු නොකිරීමෙන් පස් සෝදාගෙන ගොස් ගල් මතුවී ගමනා ගමනයට අපහසු හා අවදානම් තත්ත්වයක් ඇති වී තිබූ බව 2015 ජුනි 22 දින කරන ලද භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) රත්මලවින්න බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.980,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2014 සැප්තැම්බර් 11 වන දින ගිවිසුම් අත්සන් කර තිබුණි ගොඩනැගිල්ලෙහි අත්තිවාරම සහ කොන්ක්‍රීට් කණු 21 ක් ඉදිකර ගොඩනැගිල්ලේ පළමු අදියර 2014 දෙසැම්බර් 11 දින වන විට අවසන් කර තිබුන ද,එම දින සිට එම ගොඩනැගිල්ල වල් බිහිවී තිබීමත්,කොන්ක්‍රීට් කණුවල ඉහලට ඇති කම්බි මලකඩ කා තිබීමත් හේතුවෙන් ඒ සඳහා ගෙවන ලද රු:-255,045 නිශ්කාර්ය වියදමක් වී තිබු බව 2015 ජුනි 22 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අණාවරණය විය.

(ඇ) කොළඹ,මඩකලපුව මාර්ගයේ 148 වැනි කිලෝමීටර් කනුව ආසන්නයේ රත්මලවින්න ස්ථානයේ මාර්ග උරහිස පදිකයන්ගේ පහසුව සඳහා කොන්ක්‍රීට් තහඩු යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.90,892 ක් වැයකර (500 mm x 770 mm x 125 mm ) ප්‍රමාණයේ කොන්ක්‍රීට් කණු 51 ක් 2015 අගෝස්තු මස වන විට සකස් කර තිබුනද, විගණිත දිනය වූ 2016 මාර්තු 31 දක්වා කොන්ක්‍රීට් තහඩු යොදා සකස් කිරීමට කටයුතු කර නොතිබුණි .

(ඈ) ප්‍රජාපාදක සංවිධාන වලට වැඩ කොන්ත්‍රාත් පැවරීමේ දී මූල්‍ය තත්ත්වය සම්බන්ධ ලිපි ලේඛන, එලපුරුද්ද සනාථ කරන ලිපිලේඛන පරික්ෂා කර බලා යෝග්‍යතාවය සමාලෝචනය කිරීමකින් තොරව අවස්ථා 25 කදී එකතුව රු.10,734,100 ක්වූ සෘජු කොන්ත්‍රාත් 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 වගන්තිය විධි විධාන වලට පටහැනිව ප්‍රජාපාදක සංවිධාන වලට පිරිනමා තිබුණි.

(ඉ) පවරනු ලබන කොන්ත්‍රාත්තුව ප්‍රජාපාදක සංවිධානයේ / සමිතියේ බල ප්‍රදේශ සීමාවන් තුළ විය යුතු වුවත් ඊට පටහැනිව අවස්ථා 10 යක දී රු. 4,391,996 ක් වටිනා කොන්ත්‍රාත්තු බලප්‍රදේශයෙන් පරිබාහිර ප්‍රජාපාදක සංවිධාන වලට පවරා තිබු බව නිරීක්ෂණය විය.

3.3 වතක්ම් කළමණාකරණය

---------------------------

**නිෂ්ක්‍රීය වත්කම්**

------------------

එකතුව රු. 6,625,000 ක් වූ සභාවේ වාහන හා යන්ත්‍ර උපකරණ වර්ෂ එකේ සිට වර්ෂ තුනකට වැඩි කාලපරිච්ඡේදයක් දක්වා නිශ්කාර්යව තිබූ බව නිරීක්ෂණය විය.

3.4 බෙලිහුල්ඔය "දිය පහස" ගිමන්හල

------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සතු බෙලිහුල්ඔය "දිය පහස" ගිමන්හල පරිශ්‍රය තුල 2014 වර්ෂයේ බදුකරු විසින් සභාවේ ලිඛිත අවසරයකින් තොරව සිදුකළ ඉදිකිරිම සඳහා සභාපතිගේ උපදෙස් මත කාර්මික නිලධාරීන් විසින් ඒ සඳහා ලද රු.289,682 ක තක්සේරුවක් කර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. මෙම ඉදිකිරීම බදුකරු සමඟ එළඹ තිබු ගිවිසුමේ 6 වන වගන්තියේ සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධින වලට පටහැනිව, ඉදිකිරීමක් විය.
ii. සභා අරමුදලට ලැබිය යුතු හිඟ කුලී අදායම වූ රු:55,924 ක් තක්සේරු වටිනාකමකින් අඩුකර ඉතිරි මුදල වූ රු:233,758 ක් සභාව විසින් බදුකරු වෙත ගෙවා තිබීම සහා අරමුදලට නීත්‍යානුකූල නොවූ වැය බරක් වී තිබුණි.

(ආ) බෙලිහුල්ඔය "දිය පහස" ගිමන් හල 2016 වර්ෂය සඳහා බදු දීමට අදාල බදු ගිවිසුමේ 11 වගන්තිය ප්‍රකාරව බදුකරු විසින් ගිමන්හලේ එහි යම් කොටසක භුක්තිය අන්‍යයෙකුට විකිණීම,පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම නොකළ යුතු නමුත් රු.155,000 කට බදු ගත් බදුකරු විසින් එය රු.250,000 කට අතුරු බදු දී තිබුනද, ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් බදුකරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ඇ) "දියපහස" ගිමන් හල සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථානයක් බැවින් එම ස්ථානය පවත්වාගෙන යාමට අදාලව සභාව වෙත අදායම් උපදවාගත හැකි මූලාශ්‍ර තිබියදීත් ඒවා නිවැරදිව හඳුනාගෙන ඊට අදාලව ගාස්තු අයකරීම සම්බන්ධයෙන්1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවල විධිවිධාන අනුව අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 වාහන පාලනය

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වාහන ලොග් සටහන් පොත් හා දෛනික ධාවන සටහන් පොත් පවත්වාගත යුතු නමුත් අංක WP - PL 7541 දරණ කැබ් රථය ,WP-ZA -5076 දරණ JCB බැකෝ ලෝඩර් යන්ත්‍ර සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් ධාවනය කරනු ලබන වාහන 10 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශය විධිවිධාන ප්‍රකාරව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ ඇති මෝටර් වාහන පිළිබඳව මිලදී ගත් දිනය,පිරිවැය,වර්ගය,හා මාදිලිය ආදී විස්තර ඇතුලත් වාහන ලේඛණයක් පවත්වා ගොස් නොතිබුණි.

(ඈ) ගර්හිත තත්ත්වයේ පවතින අංක 151 -4393 දරණ හීරෝ හොණ්ඩා වර්ගයේ යතුරු පැදිය සහ අංක 53-5630 දරණ මිත්සුබිෂි වර්ගයේ කැබ් රථය සම්බන්ධයෙන් 2015 ජුලි 15 දිනැති අංක 02/15 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජුනි 05 වන දිනැති අංක PCMO/PR/2013 දරණ ජනාධිපති ලේකම්වරයාගේ ලිපියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) සෑම මාස 06 කට වරක්ම වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂාවට ලක් කළ යුතු නමුත්, සභාව විසින් ධාවනය කරනු ලබන වාහන 10 ක් සම්බන්ධයෙන් 1990 ඔක්තෝම්බර් මස 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාව සතු රථවාහන 15 ක් සම්බන්ධයෙන් අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 **ව්‍යාපෘති ප්‍රමාද කිරිම**

-----------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන - 2015 යටතේ අනුමත වූ එකතුව රු.3,749,000 ක් වටිනා ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂය තුළද වැඩ ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි නොතිබුණි.

04. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තු ගත වියදම්,තත්‍ය වියදම් සමඟ සැසඳීමේ දී පුනරාවර්තන වියදම් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 22 සිට සියයට 59 දක්වා වූ විචලනයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර තිබුනු ප්‍රතිපාදන වලින් සියයට 36 සිට සියයට 87දක්වා විචලනයක් ද නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

05. **පද්ධති හා පාලනය**

------------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ගබඩා පාලනය
(ඈ) මූල්‍ය පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) වාහන උපයෝජනය